# මහජනතාව වෙත කරනු ලබන දැනුම් දීමයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# පිරමීඩාකාර ව්‍යාපාරවල නිරත වීම දඬුවම් ලැබිය හැකි වරදකි!

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලැබුණු පැමිණිලිවලට අනුව පහත සඳහන් ආයතන විසින් 1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තිය උල්ලංඝනය කරමින් තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන්නේද යන්න සොයා බැලීම සඳහා විමර්ශනයන් ඉහත බැංකු පනතට අනුකූලව සිදු කරන ලදී. මෙම විමර්ශන වාර්තාවලට අනුව, පහත ලැයිස්තුගත ආයතන බැංකු පනතේ 83(ඇ) වගන්තියට පටහැනි ලෙස ක්‍රියා කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තීරණය කරන ලදී.

1. Tiens Lanka Health Care (Pvt) Ltd.
2. Best Life International (Pvt) Ltd.
3. Global Lifestyle Lanka (Pvt) Ltd.
4. Mark-Wo International (Pvt) Ltd.
5. V M L International (Pvt) Ltd.
6. Fast 3Cycle International (Pvt) Ltd (F3C)
7. Sport Chain App, Sports Chain ZS Society Sri Lanka
8. OnmaxDT

යම් තැනැත්තෙකු 1988 අංක 30 දරන බැංකු පනතේ 83(ඇ) වගන්තියේ විධි විධාන කඩ කරන ආකාරයේ යෝජනා ක්‍රම කෙලින්ම හෝ අන්‍යාකාරයකින් ආරම්භ කිරීම, අර්පණය කිරීම, ප්‍රවර්ධනය කිරීම, ප්‍රචලිත කිරීම, පැවැත්වීම, එවැනි යෝජනා ක්‍රම සඳහා මුදල් සැපයීම, හෝ එවැනි යෝජනා ක්‍රම කළමනාකරණය කිරීම හෝ විධාන කිරීම දඬුවම් ලැබිය හැකි වරදකි.

එවැනි වරදක් සඳහා වන දඬුවම් ලෙස, වසර තුනකට නොවැඩි සිරදඬුවමක් හෝ රුපියල් මිලියනයකට නොවැඩි දඩයක් හෝ සිරදඬුවම් සහ දඩ යන දෙකම හෝ ඇතුළත් විය හැකිය. වරද සිදු කරන ලද්දේ සිතාමතාම හෝ දැන දැනම නැතහොත් එම ක්‍රියාව මගින් වෙනත් යම් තැනැත්තෙකුට අලාභයක් හෝ හානියක් සිදුවන බව දැන දැනම වන අවස්ථාවක එම පුද්ගලයා අවුරුදු තුනකට නොඅඩු සහ අවුරුදු පහකට නොවැඩි කාලයක් සඳහා බරපතළ වැඩ ඇතිව බන්ධනාගාරගත කිරීමකට සහ රුපියල් මිලියන දෙකක් හෝ එම යෝජනා ක්‍රමයේ සහභාගිකරුවන්ගෙන් ලබාගත් බවට හෙළි වුන හෝ හෙළි කරන ලද එකතු මුදලේ දෙගුණයක වටිනාකමින්යුත් ශ්‍රී ලංකා මුදල් ප්‍රමාණයක් යන දෙකෙන් වඩා වැඩි මුදලට සමාන දඩයකටද යටත් විය හැකිය.

ඒ අනුව, නීතියෙන් දඬුවම් ලැබිය හැකි මෙවැනි ආකාරයේ ක්‍රියාකාරම්වලින් වැළකී සිටින ලෙස දැනුවත් කර සිටිමු.

තවද, දැනට පිරමීඩ යෝජනා ක්‍රම පවත්වාගෙන යන ලෙස/පැවැත්වූ ලෙස තීරණය කර ඇති ඉහත ලැයිස්තුගත ආයතන සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව යම් යම් එකඟතාවන්ට එළැඹී ඇති බවට සමාජයේ ඇතැම් කොටස් විසින් සිදු කරනු ලබන ප්‍රකාශයන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඒ අනුව, මෙසේ නම් කරන ලද පිරමීඩාකාර ව්‍යාපාර සඳහා, බැංකු පනතේ 83(ඇ) වගන්තිය යටතේ අපරාධමය නඩු කටයුතු පැවරීමට සලකා බලනු පිණිස ගරු නීතිපතිවරයා වෙත ඉල්ලීම් යොමු කර ඇති බව ද දන්වා සිටිමු.


ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01

(Hotline) 1935 / +94 11 247 7966